වාර්ෂික වාර්තාව

2019

බුද්ධශාසන අරමුදල

අංක 135
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07

දුරකථන - 0112303293
විද්‍යුත් තැපෑල- bsfund@mbs.gov.lk
වෙබ් අඩවිය - www.mbs.gov.lk/web/buddhasasana-fund

පටුන

	පිටු අංකය
01. බුද්ධශාසන අරමුදල	
1.1 දැක්ම	1
1.2 මෙහෙවර	1
1.3 අරමුණු	1
1.4 කාර්යභාරය	1
1.5නෛතික රාමුව	1-2
02. සංවිධාන ව්‍යුහය	2
03. කාර්ය මණ්ඩලය	3
04. අරමුදලේ කාර්ය සාධනය	
4.1 සාමණේර ආයතන පවත්වාගෙන යෑම සඳහා මූල්‍යාධාර ලබාදීම	3-4
4.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීම	5
4.3දුෂ්කරවිහාරස්ථානසඳහා සනීපාරක්ෂකපහසුකම්සඳහාආධාරලබාදීම	5-6
4.4 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය	6-7
4.5 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන	7-8
4.6වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගික පුහුණුව ලබා දීම	9-10
4.7 චීන භාෂා හා සංස්කෘතික අධ්‍යයන ආයතන පිහිටුවීම	10-11
4.8 බුදුපුත් සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන	11-12
05. ඉදිරි ඉලක්ක	12-13
06. මූල්‍යකළමණාකරණය	
6.1ආදායම් වියදම් ගිණුම	14
6.2 ශේෂ පිරික්සුම	15-16
6.3 ශේෂ පත්‍රය	17
6.4 විගණකාධිපති වාර්තාව	18-31

01. බුද්ධශාසන අරමුදල

1.1 දැක්ම

බොදු පිළිවෙත් රකින, සාරධර්ම සපිරි ගුණගරුක දැහැමි සමාජයක් බිහිකිරීම.

1.2 මෙහෙවර

සම්බුදු ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාත්මික හා සමාජීය සංවර්ධනයට දායක වෙමින්, විහාරස්ථානයන්හි ප්‍රත්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමෙන් බුද්ධශාසනයේ ස්ථීර පැවැත්ම වෙනුවෙන් කටයුතු සිදු කිරීම.

1.3 අරමුණු

I. බුද්ධශාසනය ආරක්ෂා කිරීම සඳහා සුදුසු වැඩ සටහන් සිදු කිරීම.

II. බුද්ධශාසනය පෝෂණය කිරීම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

1.4 අරමුදලේ කාර්යභාරය

1. සාමණේරයන් වහන්සේලා පස් නමකට වඩා සාමණේර අධ්‍යාපනය ලබා දෙන සාමණේර ආයතන සඳහා මාසික මූල්‍යාධාර පිරිනැමීම.

2. සාමණේර ආයතනවල සාමණේරයන් වහන්සේලාගේ දහම් දැනුම හා වත් පිළිවෙත් පිළිබඳ වාර්ෂික ඇගයීම.

3. සම්බුද්ධත්ව ජයන්ති සාමණේර කැපකරු යෝජනා ක්‍රමය

4. භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

5. දිවයින පුරා අඩු පහසුකම් සහිත විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම

6. වැඩිහිටි වියේදී පැවිදි බිමට ඇතුළත්වූ සහ තරුණ ස්වාමීන්වහන්සේලා සඳහා පැවිදි ප්‍රතිපදාවට අයත් වත්පිළිවෙත්, දහම් දැනුම ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම

7. චීන භාෂා හා සංස්කෘතික අධ්‍යයන ආයතන පිහිටුවීම


8. බුදුපුත් සුරක්ෂා සෞඛය ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

1.5 අරමුදල පිහිටාඇතිනෛතිකරාමුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය අනුව "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙහි හා 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදය මඟින් සියළුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම

විය යුත්තේය" යන්න දැක්වේ. එකී කාර්ය භාරයට අනුව 1990 අංක 35 දරන පනතින් බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතුකිරීම හා සම්පාදනය කිරීම සඳහා බුද්ධශාසන අරමුදල ලෙස මෙම අරමුදල පිහිටුවා ඇති අතර බුද්ධශාසනය ආරක්ෂා කිරීමෙහි සහ පෝෂණය කිරීමෙහි නිරතව සිටින ආයතන කළමණාකරණයෙහිලා සහායවීමද අරමුදලේ කාර්ය කර ගෙන යාමට ආනුශාංගික වන හෝ හිතකරවන වෙනත් සියලු ක්‍රියාවන් සහ දේවල් කිරීම සඳහා බුද්ධශාසන අරමුදල කටයුතු කළ යුතු වන බව එම පනතින් නියම කර ඇත.

02. සංවිධාන ව්‍යුහය



03. කාර්යය මණ්ඩලය

1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 7 (ඊ) හා 14 වැනි වගන්තිය අනුව පාලක මණ්ඩලය විසින් පනවනු ලබන නීතිවල සඳහන් පරිදි අරමුදලේ ප්‍රධාන විධායකයා ලෙස පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන ලේකම් වරයෙකු සිටිය යුතුඅතර එම ලේකම්වරයා ගණන් දීමේ නිලධාරියාද වන අතර හැකි සෑම විටම බුද්ධශාසන අමාත්‍යාංශයට අනුයුක්ත රජයේ මාණ්ඩලික නිලධාරීයෙකු අතරින් නම් කරගත යුතු බව දක්වා ඇත.

මේ අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු තම නිත්‍ය රාජකාරියට අමතරව මෙම ලේකම් තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලැබේ. එමෙන්ම අරමුදලේ ගණකාධිකාරී ලෙස අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වැඩ බැලීම සිදු කරනු ලබන අතර තම නිත්‍ය රාජකාරී වලට අමතරව අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය අරමුදලේ කටයුතු සඳහා සහාය වේ.

04. අරමුදලේ කාර්යසාධනය

4.1 සාමණේර ආයතන පවත්වාගෙන යාම සඳහා මූල්‍යාධාර ලබාදීමේ වැඩසටහන

ගිහි ජීවිතය අතහැර පැවිදි ජීවිතයට ඇතුළත් වන දරුවා කෙටි කාලයකින් පිරිවෙන් අධ්‍යාපනය වෙත යොමු කෙරේ. අතීතයේ පැවති ක්‍රමය වූයේ කුල දරුවෙකු වසර දෙක තුනක් විහාරස්ථානයක සිටීමින් පැවිදි ජීවිතය හා බණ දහම් පිළිබඳ අවබෝධය ලබා ගනිමින් සිය කැමැත්තෙන්ම පැවිදි ජීවිතයට ඇතුළු වීමයි. නමුත් වර්තමානයේ පැවිදි ජීවිතයට ප්‍රවේශ වන කුල දරුවන්ට සසුන්ගත වීමට පෙර පැවිදි ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඇති අවස්ථා අඩුය.

මෙම අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් බුද්ධශාසන අරමුදල පිහිටුවීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන හඳුනාගත හැකිවේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂූත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂු ජීවිතය පිළිබඳ යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත් පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වී තිබේ. දසධම්ම සූත්‍රයෙන් නිරූපිත සම්පූර්ණ භික්ෂූන් වහන්සේ නමක් සමාජයට දායාද කිරීම, භික්ෂු ජීවිතය බෞද්ධ පිළිවෙත් අනුව සකස් වූ ජීවිතයක් බව අවබෝධ කර දීම, භික්ෂූන් වහන්සේ හා ගිහියා අතර වෙනස හා භික්ෂූත්වයේ උත්තරීතර භාවය අවබෝධ කරවීම, වෙනත් කෙනෙකුට බරක් නොවී භික්ෂු ජීවිතය ගත කළ යුතු ආකාරය උගැන්වීම සාමණේර අධ්‍යාපනයෙන් සිදු කරනු ලැබේ.

<u>ආධාර ලැබීමට තිබිය යුතු අවශ්‍යතා</u>

I. දහම් පාසල හැරුණු විට වෙනත් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන නොයනු ලබන විහාරස්ථානයක් විය යුතුය.
II. තුන් බෝධිය තිබිය යුතුය.
III. අධ්‍යාපනය ලබන සාමණේර හිමිවරුන් නේවාසිකව වැඩ විසිය යුතුය.
IV. නේවාසිකව වැඩ විසීම සඳහා අවශ්‍ය ලැගුම් ගෙවල්, ජලය, විදුලිය, වැසිකිළි ආදි මූලික අවශ්‍යතා තිබිය යුතුය.

V. උදෑසන හා දවල් දානය ප්‍රමාණවත් පරිදි ලැබෙන දායක පිරිස් සහිත විහාරස්ථානයක් විය යුතුය.

VI. කුඩා සාමණේර හිමිවරුන් පුහුණු කරවීමට උගත්, සිල්වත් උපසපන් උපාධ්‍යායන් වහන්සේ නමක් සිටිය යුතුය.

2019 වසරේ මූල්‍යාධාර ලබා දුන් ආයතන

අනු අංක	ආයතන (නම/ලිපිනය)	ආයතනයේසිටින සාමණේර හිමිවරු ගණන
1	මිද්දෙණිය ශ්‍රී වජිරාරාම සාමණේර ආයතනය	10
2	මහනුවර ශ්‍රී ධම්මපාල සාමණේර ආයතනය	06
4	ඇඹුල්පුර සම්බුද්ධාලෝක සාමණේර ආයතනය	06
5	ගාල්ල විද්‍යාදීප සාමණේර ආයතනය	05
6	කටුගස්තොටශ්‍රී සුධම්මානන්ද සාමණේර ආයතනය	14
7	තංගල්ල සිරි අරියවංශ සාමණේර ආයතනය	08
8	දඹුල්ල ශ්‍රී ජිනරතන සාමණේර ආයතනය	14
9	දෙනියාය ශ්‍රී සාරානන්ද සාමණේර ආයතනය	15
10	හිරිපිටියශ්‍රී විද්‍යාවංශ සාමණේර ආයතනය	10
11	සියඹලාණ්ඩුව සරණංකර සාමණේර ආයතනය	15
12	හඳපානාගල ශ්‍රී සුමන සාමණේර ආයතනය	16
13	රත්නපුර සිරි සුමංගල සාමණේර ආයතනය	11
	එකතුව	**130**

මෙම වසරේදී දිවයිනේ විවිධ ප්‍රදේශවල තිබෙන සාමණේර ආයතන 10 ක් සඳහා රුපියල් රු.765,000/=ක මූල්‍යාධාර ලබා දීම සිදු කර ඇත.

4.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීමේ වැඩසටහන

බුද්ධශාසන අරමුදල පිහිටුවීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන පැහැදිලිව හඳුනාගත හැකි වේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂූත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂූන් වහන්සේගේ ජීවිතය පිළිබඳව යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත්පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වේ.

මෙකී අරමුණු ඔස්සේ පුරුදු පුහුණු වූ සාමණේර හිමිවරුන්ගේ දැනුම හා ආකල්ප පිළිබඳ පරීක්ෂා කර බැලීමක් මෙහිදී සිදු කෙරේ. ඒ අනුව පුහුණුව ප්‍රමාණවත්ව ලැබීමෙන් පසු සෑම වසරක් අවසානයේ දී බුද්ධශාසන අරමුදල විසින් පවත්වනු ලබන වර්ෂ අවසාන විභාගයට සාමණේර භික්ෂූන් වහන්සේලාට පෙනී සිටිය හැකි වේ. මෙම ඇගයීමේ දී ලිඛිත පරීක්ෂණයක් මෙන්ම ප්‍රායෝගික හැකියාව පිළිබඳව පරීක්ෂණයක් ද නායක ස්වාමීන්වහන්සේලාගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කෙරේ. මෙම පරීක්ෂණයෙන් විශිෂ්ට හා අධිශ්‍රේණියේ සාමාර්ථ ලබා ගන්නා සාමණේරයන් වහන්සේලාට විශේෂ ඇගයීමක් බුද්ධශාසන අරමුදල මඟින් සිදු කෙරේ.

ක්‍රියාත්මක ක්‍රමවේදය

I. ලියාපදිංචි කර ඇති සාමණේර ආයතන වලින් විභාගය සඳහා අයදුම් පත්‍ර කැඳවීම
II. විභාග කටයුතු සංවිධානය කිරීම
III. විභාගය පැවැත්වීම
IV. ශිෂ්‍යත්ව ලබා දීම

2019 වර්ෂයේ පවත්වන ලද පරීක්ෂණය පිළිබඳ තොරතුරු

❖ පරීක්ෂණය පැවැත්වූ ස්ථානය	කැළණිය,පෑලියගොඩ, විද්‍යාලංකාර පිරිවෙන
❖ පැවැත්වූ දිනය හා වේලාව	2019.12. 25 (පෙ.ව 9.00 - ප.ව 3.00)
❖ පරීක්ෂණයට පෙනී සිටි ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව	49
❖ වැය කළ මුදල	රු580,354/-

4.3 දුෂ්කරවිහාරස්ථානසඳහාසනීපාරක්ෂකපහසුකම්සඳහාආධාරලබාදීම

දිවයින පුරා පිහිටි විහාරස්ථාන අතුරින් මූලික පහසුකම් සම්පූර්ණ නොවූ විහාරස්ථාන රාශියක් දැකිය හැකිය. එබැවින් අවම පහසුකම් සම්පූර්ණ නොවූ එම විහාරස්ථානවල වැඩවසන භික්ෂූන්වහන්සේලාට සනීපාරක්ෂක හා වෙනත් පහසුකම් දියුණු කර ගැනීම සඳහා අවස්ථාව සලසාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

වර්ෂයකට එක් දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්තෝරාගෙන එම බල ප්‍රදේශය සම්බන්ධව ප්‍රමුඛතා ලේඛනය අනුව සැකසූ වාර්තාවක් අනුව විහාරස්ථාන තෝරා ගැනීම හා සෘජුව බුද්ධශාසන අරමුදල වෙත කෙරෙන ඉල්ලීම්ද ප්‍රාදේශීය ලේකම්/ බෞද්ධකටයුතු සමායෝජකගේ නිර්දේශය සහිතව ලබා ගෙන පාලක මණ්ඩල අනුමැතියෙන් මූල්‍යාධාර ලබා දීම සිදුකෙරේ.

2019 වර්ෂයේදී සනීපාරක්ෂක මූල්‍යාධාර ලබාදෙන ලද විහාරස්ථාන

අනු අංකය	විහාරස්ථානයේ නම සහ ලිපිනය
1	ශ්‍රී සුගත මහා විහාරය, විහාර හල්මිල්ලකුලම, අනුරාධපුරය
2	ශ්‍රී කාවන්තිස්ස විහාරය, කොවුල්ආර, සෙවනගල විහාරස්ථානය
3	මානිංගමුව ශ්‍රී සම්බුද්ධ ධර්ම නිකේතනය, මහවිලච්චිය
4	ශ්‍රී ප්‍රඥාසාගර විහාරය, රිදීගම
5	පිටුවල, ඇල්පිටිය පුරාණ විහාරය
6	අලව්ව ශ්‍රී සම්බුද්ධාලෝක විහාරය
7	කළුතර දකුණ, විලේගොඩ, ශ්‍රී පත්මාරාමය
8	රත්නපුර, මානෙල් ගල්ලෙන වන සෙනසුන, අයගම
9	පැල්මඩුල්ල දිද්දෙණිය පුරාණ විහාරය
10	පස්යාල, ඇල්ලමුල්ල ශ්‍රී රණතුංගාරාමය, මීරිගම
11	අඹේපුස්ස, පිරිස්යාල, සේනනායක මුදලින්දාරාම මහා විහාරය, මීරිගම

2019 වර්ෂයේ සනීපාරක්ෂක කටයුතු සඳහා මූල්‍යාධාර වශයෙන් රු 299,920/- මුදලක් වැය කර ඇත.

4.4 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය

සම්බුද්ධත්ව ජයන්ති වර්ෂයට අදාළව හා 2010 වර්ෂයේ සිට පැවිදි වූ සාමණේර හිමිවරුන් සඳහා විශේෂ සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමයක් හා 2014 වර්ෂයේ සැප්තැම්බර් මාසයෙන් පසු පැවිදි වූ සාමණේර හිමිවරුන් සඳහාද මෙම ව්‍යාපෘතිය අදාළ වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ඉහත කාලය තුළ පැවිදි බිමට පත් සාමණේරයන් වහන්සේලාගේ අධ්‍යාපන කටයුතු සඳහා හෝ වෙනත්

ප්‍රත්‍ය අවශ්‍යතා සඳහා මූල්‍යමය දායකත්වයක් ලබා දීම තුළින් උන්වහන්සේලාගේ ශාසන පැවැත්මට සහයක් ලබාදීම අපේක්ෂා කෙරේ.

මෙම සාමණේර ශිෂ්‍යාධාර කැපකරු ක්‍රමයට තෝරාගනු ලබන්නේ පහත සඳහන් සුදුසුකම් ඇති සාමණේර හිමිවරුන්ය.

i. 2010 ජනවාරි 01 දින සිට 2013 වෙසක් සතියෙහි අවසාන දිනය දක්වා වූ කාලය තුළ පැවිදි කළ සාමණේර හිමිනමක් විය යුතුය.
ii. වයස අවුරුදු 18 ට අඩු විය යුතුය.
iii. පැවිදි වී මාස 3 ක් ගත වී තිබිය යුතුය.
iv. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ සාමණේර ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
v. එක් විහාරස්ථානයකින් උපරිම දස නමකි.

පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි සාමණේර කැපකරු ශිෂ්‍යාධාර ක්‍රමයට ඇතුළත්වීමට නව අයදුම්පත් එවා ඇති සාමණේර ස්වාමීන් වහන්සේලා සඳහා මසකට 1000/= බැගින් ගෙවීම සඳහා 82 වනපාලක මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව 2019අගෝස්තු මස සිට ගෙවීම් කරන ස්වාමීන් වහන්සේලා සඳහා රු. 700 බැගින්ද , නව හිමිකම්ලාභීන් සඳහා රු 1000 බැගින්ද ගෙවීම් කිරීමට කටයුතු කර ඇති අතර මෙම වසරේදී ශිෂ්‍යාධාර වෙනුවෙන් වැය කර ඇති මුදල රු. 4,083,145/= කි. මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවීම් තැපැල් කාර්යාල හරහා සිදු කෙරෙන බැවින් මෙම මුදලට තැපැල් කාර්යාල සඳහා වන කොමිස් මුදලක් ද ඇතුළත් වී ඇත.

4.5 භික්ෂුවෛද්‍යාධාරවැඩසටහන

ශ්‍රී ලංකාව පුරා වැඩසිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් ලෙස මෙය ක්‍රියාත්මක කෙරේ. 2559 වෙනි වෛශ්‍යාක්‍ය මංගල්‍ය නිමිති කොට ගෙන දිවයින පුරා වැඩසිටින අඛණ්ඩව වෛද්‍ය ප්‍රතිකාර ලබන භික්ෂූන් වහන්සේලාට වෛද්‍ය පහසුකම් සඳහා ආධාර ලබා දීම මෙයට අදාළ වේ.

මෙහිදී දිවයින පුරා වැඩසිටින සුදුසුකම් ලත් භික්ෂූන් වහන්සේලා අතුරින් ප්‍රාදේශීය ලේකම් හා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී හිමියන්ගේ නිර්දේශයන්ද වෛද්‍ය නිර්දේශයන්ද මත භික්ෂූන් වහන්සේලා වෙත වෛද්‍යාධාර ලෙස මසකට රු.5000/= ක් හෝ රු.3000/= බැගින් වන මුදලක් ගෙවීම සිදුවේ.

2019 වසරේ දී මූල්‍යාධාර ලබා දුන් නව ලියාපදිංචිගත ස්වාමීන්වහන්සේලා පිළිබඳ තොරතුරු

අනු අංකය	ස්වාමීන් වහන්සේගේ නම	රෝගය	මාසිකව ගෙවනු ලැබූ මුදල
1	පූජ්‍ය ගලහිටියේ සිරි පදුම හිමි	දියවැඩියාව	3000/-
2	පූජ්‍ය දොඩම්වල ධම්මරතන හිමි	දියවැඩියාව	3000/-
3	පූජ්‍ය වකමුල්ලේ චන්දවිමල හිමි	දියවැඩියාව	3000/-
4	කටුවන සුභද්‍රා මෑණියන් වහන්සේ	දියවැඩියාව	3000/-
5	පූජ්‍ය ගොඩිගමුවේ සෝමානන්ද හිමි	අංශභාගය	5000/-
6	ගාල්ලේ ශීලා ධම්මචාරිණී මෑණියන් වහන්සේ	රක්තහීනතාව	5000/-
7	දෙනගම ධම්මසුභා මෑණියන් වහන්සේ	ආතරයිටීස්	5000/-
8	පූජ්‍ය ඉඹුල්පිටියේ වජිරධම්ම හිමි	මොළයේ ලේ කැටියක්	5000/-
9	පූජ්‍ය මඩුගල්ලේ ශ්‍රී සිද්ධාර්ථ හිමි	වකුගඩු රෝගයක්	5000/-
10	පූජ්‍ය හිරල්ලුගම විජයරතන හිමි	අංශභාගය	5000/-

මෙම වසරේ දීනව ගෙවීම් සඳහා ඉදිරිපත් කළ ඉහත ස්වාමීන්වහන්සේලා දසනමත් ඇතුළුව මුළු ස්වාමීන්වහන්සේලා 41 නමක් වෙනුවෙන් රෝගයේ ස්වභාවය අනුව දියවැඩියාව වැනි රෝග සඳහා රු.3000/= බැගින්ද ජීවිත කාලයටම ගෙවීම් කරන රෝග සඳහා රු.5000/= බැගින්ද රුපියල් 2,645,209/= ක මූල්‍යාධාර ලබා දීම සිදු කර ඇත.

4.6 වයස්ගතවපැවිදිවුභික්ෂූන්වහන්සේලාටප්‍රායෝගිකපුහුණුවලබාදීම

වයස්ගතව පැවිදි ජීවිතයට ඇතුළත් වන ස්වාමීන් වහන්සේලා වැඩිවෙමින් පවතින ප්‍රවනතාවයක්තුළ එවැනි හිමිවරු පැවිදි ජීවිතය පිළිබඳව මනා අවබෝධයකින් තොරව හැසිරෙන බැවින් එම තත්වය බෞද්ධ සැදැහැවතුන්ගේ කලකිරීමටත් විවේචනයටත් භාජනය වූ අවස්ථා තිබේ. එසේම ශාසනයට අහිත කර බොහෝදෑ කිරීමට පෙළඹීම නිසා සමාජ දෝෂදර්ශනයට ලක් වන අවස්ථා දැකිය හැකිවේ. මේ අනුව එවැනි හිමිවරුන්ට පැවිදි ජීවිතයේ ඇති උත්තරීතර භාවය හා ගිහි පැවිදි වෙනස පිළිබඳව මූලිකවත් පිළිවෙත් හා ධර්මානුකූල දැනුමක් ද ලබා දීමට මෙම වැඩ මුළු පැවැත්වේ.

දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රාදේශීය ලේකම් මඟින් අදාළ බලප්‍රදේශයේ විහාරස්ථාන වල වැඩසිටින ළමාවිය ඉක්මවා පැවිදි වූ භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු කැඳවා ගනු ලබයි. ලැබෙන තොරතුරු මත තෙදින වැඩසටහන් පැවැත්වීම අපේක්ෂා කරනු ලැබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන්ගේ සහය ලබා ගෙන උක්ත වැඩසටහන අදාළ දිස්ත්‍රික්කය තුළදී සංවිධානය කරනු ලබන අතර, එක් වැඩසටහනක් සඳහා අවම භික්ෂූන්වහන්සේලා 10 නමක් අපේක්ෂා කෙරේ.

2019වර්ෂයේපැවැත්වූවැඩසටහන් පිළිබඳ විස්තර

පළමු වැඩසටහන

දිස්ත්‍රික්කය	**මාතර**
ස්ථානය	අකුරැස්ස දස බෝධී සෙනසුන
සම්බණ්ධීකරණය	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අකුරැස්ස ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
මෙහෙයවීම	බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී පූජ්‍ය දිද්දෙනිපොත නන්දරතන ස්වාමීන්වහන්සේ
පවත්වන ලද දින	2019- 02 -26, 2019-02-27, 2019-02-28
දින ගණන	03
සහභාගී වූ හිමිවරු සංඛ්‍යාව	18

දෙවන වැඩසටහන

දිස්ත්‍රික්කය	මොණරාගල
ස්ථානය	වැල්ලවාය, තෙළුල්ල ශ්‍රී බෝධිරාජාරාමය
සම්බන්ධීකරණය	මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වැල්ලවාය, තණමල්විල, සෙවනගල, බඩල්කුඹුර ප්‍රාදේශිය ලේකම් කාර්යාල
මෙහෙයවීම	බුද්ධශාසන අරමුදලේ නිලධාරීන් හා පූජ්‍ය මෝධරවානේ සුධම්ම නාහිමි
පවත්වන ලද දින	2019- 07 -04 , 2019-07-05 2019-07-06
දින ගණන	03
සහභාගී වූ භිමිවරු සංඛ්‍යාව	19

වැඩසටහන් දෙක සඳහාම වර්ෂය තුළ වැය වූ මුළු මුදල- රු 256,555/-

4.7 චීන භාෂා හා සංස්කෘතික අධ්‍යයන ආයතන පිහිටුවීම

ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලාගේ භාෂා ඥානය හා සංස්කෘතික අනන්‍යතාවයන් පිළිබඳ අධ්‍යයනය ඉතා වැදගත් වේ. විවිධ භාෂා හා සංස්කෘතින් අතර වර්තමානයේ චීන භාෂාවට හා සංස්කෘතියට ප්‍රමුඛස්ථානයක් හිමිවේ. ඒ අනුව ශ්‍රී ලාංකීය භික්ෂූන් වහන්සේලාට චීන භාෂාව හා සංස්කෘතිය ඉගෙනීමට දිරිය දීම හා චීන භාෂාවෙන් උසස් අධ්‍යාපනයට අවස්ථාව උදා කර දෙමින් ථේරවාද හා මහායාන බුදුදහම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් කිරීමට අවස්ථාව උදාකරදීම මෙම ආයතනයේ අරමුණයි.

පිරිවෙන් අවසාන විභාගයට මුහුණ දුන් භික්ෂූන් වහන්සේලාගෙන් පාඨමාලාව හැදෑරීමට කැමති භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත්‍ර කැඳවීම, තෝරාගැනීම පරීක්ෂණ පැවැත්වීම, බඳවා ගැනීම හා ආයතන පරිපාලනය හා මෙහෙයවීම පාලක සභාවක් මගින් සිදු කරනු ලැබේ. බුද්ධශාසන අරමුදල් කාර්යාල මගින් පත් කළ විශේෂ නියෝජිතයෙකු හා බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරියා විසින් නිරීක්ෂණය කොට වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසු බුද්ධශාසන අරමුදල මගින් ආයතන ලියාපදිංචි කරනු ලැබේ. ශිෂ්‍ය ප්‍රමාණය හා පරිපාලන වියදම් සලකා ඉදිරියට පවත්වාගෙන යෑමට දිරි ගැන්වීමක් ලෙස පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රදානය පාලක මණ්ඩලයෙන් නිර්දේශයෙන් සිදු කරනු ඇත.

අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කරමින් පැවැති පාඨමාලා ක්‍රමය අවලංගු කර උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස සංවර්ධනය කිරීම හා අධ්‍යයන කාල සීමාව වර්ෂයක් දක්වා වැඩි දියුණු කිරීමට 2019 වර්ෂයේදී පැවැති 81 වන පාලක මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත.

2019 වර්ෂයේදී චීන භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව වෙනුවෙන් වැය කළ මුදල

ස්ථානය- කැළණිය, පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන

අනු අංකය	ගෙවීම් කළ අයිතමය
1	චීන භාෂා අධ්‍යාන ආයතනට අවශ්‍ය ශිෂ්‍ය අත්පොත මුද්‍රණය කිරීමට අදාළව
2	පළමු කණ්ඩායම සඳහා 2019 ජනවාරි මස මාසික දීමනා ගෙවීම
3	පළමු කණ්ඩායම සඳහා 2019 පෙබරවාරි හා මාර්තු මස මාසික දීමනා ගෙවීම
4	පළමු කණ්ඩායම සඳහා 2019 ජුනි, ජූලි , අගෝස්තු මාසික දීමනා ගෙවීම
5	පළමු කණ්ඩායම සඳහා 2019 සැප්තැම්බර්මස මාසික දීමනා ගෙවීම
6	පළමු කණ්ඩායම සඳහා 2019 ඔක්තෝම්බර් මස මාසික දීමනා ගෙවීම
7	දෙවන කණ්ඩායමේ පළමු මස සඳහා (ඔක්තෝම්බර් මස)
8	චීන ශිෂ්‍යත්ව වැඩසටහනට අදාළව CD පටය සංවර්ධනය කිරීමට
9	දෙවන කණ්ඩායමේ දෙවනමස සඳහා (නොවැම්බර් මස)
10	දෙවන කණ්ඩායමේ තෙවන මස සඳහා (දෙසැම්බර් මස)

මෙම පාඨමාලාව සඳහා මෙම වසරේදී වැය කළ මුදල රු 352,210/=කි.

4.8 බුදුපුත් සුරක්ෂා සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන

සුවිශාල වූ ශාසනික මෙහෙවරකනිරතවෙන ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙළක් ලෙස ‘‘බුදුපුත් සුරක්ෂා’’ නමින් වෛද්‍යාධාර වැඩසටහනක් ආරම්භ කර ඇති මෙම වැඩසටහනට වෙනත් රක්ෂණ ක්‍රමයකින් ආවරණය නොවන විවිධ ස්වාමීන්වහන්සේලා ඇතුළත් කරමින් ආධාර ලබාගැනීමට සුදුසු ස්වාමීන් වහන්සේලා ලියාපදිංචි කරමින් හිමිකම්පත් ප්‍රදානය කිරීම සිදුවේ.
මෙම ව්‍යාපෘතිය බුද්ධශාසන අරමුදලින් රු. මිලියන 40 ක් හා මහාභාණ්ඩාගාරයෙන් ලද රු.මිලියන 50 ක් ඇතුළුව රු.මිලියන 90 ක මුදලින් ආරම්භකර මීට අමතරව දෙස් විදෙස් දානපතීන්ගේ අනුග්‍රහයෙන්ද ලබාගැනීමට සැලසුම් කර ඇත.

මෙය ක්‍රියාත්මක කිරීම වරින්වර අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර ඇති අතර 2019 මාර්තු මස 20 වන දින අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මේ සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය හිමි වී ඇත. බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය මෙම ව්‍යාපෘතියේද පාලක මණ්ඩලය වන අතර මෙහි කටයුතු කළමණාකරණය හා පාලනය කිරීම බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරීන් හත්දෙනෙකුගෙන් සමන්විත අනුකමිටුවක් මගින් සිදුවේ.

මෙම වැඩසටහනේ ලියාපදිංචිවීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සිටින බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් වෙතින් නියමිත ආකෘතිපත්‍රයක් ලබාගෙන සම්පූර්ණ කරන ලද අයදුම්පත බෞද්ධ කටයුතු සමායෝජක, ප්‍රාදේශිය ලේකම් මගින් අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය. එවිට නියමිත සුදුසුකම් පරීක්ෂා කර සුදුසු ස්වාමීන්වහන්සේලා වෙත හිමිකම්පතක් නිකුත් කරනු ලැබේ.

හිමිකම්පත ලැබීමෙන් අනතුරුව විවිධ අසනීප සඳහා රෝහල් ගතවීම් වලදී දරන ලද රෝහල් ගාස්තු, වෛද්‍ය ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු හා ඖෂධ ගාස්තු වෙනුවෙන් දරන ලද මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට අදාළ අයදුම්පත පුරවා බෞද්ධ කටයුතු සමායෝජක, ප්‍රාදේශිය ලේකම්, හරහා නියමිත බිල්පත්ද සමඟ අමාත්‍යාංශය වෙත හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය. හිමිකම් ගෙවීම 2019 සැප්තැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වේ.

ගෙවීම් පිළිබඳ විස්තර

2019 වර්ෂයේ ලියාපදිංචි සංඛ්‍යාව	8521
ගෙවා ඇති හිමිකම් ඉල්ලීමේ සංඛ්‍යාව	07
ගෙවා ඇති මුදල	රු132,000/- (පෞද්ගලික පරිත්‍යාගශීලීන් විසින්)

05. ඉදිරි ඉලක්ක

2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

අනුඅංකය	වැඩසටහන	2020 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක
1.	සාමණේර ආයතන පවත්වාගෙන යාම සඳහා මූල්‍යාධාර ලබා දීම	• සාමණේර ආයතන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අතර ඇතැම් දිස්ත්‍රික්කයන්හි සාමණේර ආයතන එකක් හෝ නොපවතින බැවින් සියලුම නිකායන්ට හා පාර්ශවයන්ට අයත් විහාරස්ථානවල සාමණේර ආයතන ඇති කිරීමට ඉලක්ක කර ඇති අතර 2020 වර්ෂයේ සාමණේර ආයතන 10 ක් ලියාපදිංචි කර ගනිමින් රු 2400,000/- ක සාමණේර ආයතන මූල්‍යාධාර ලබාදීමට අපේක්ෂා කෙරේ.

2.	සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය	• සාමණේර හිමිවරු 1500 නමක් සඳහා රු 13,800,000/- ක මුළු ශිෂ්‍යාධාර මුදල් ප්‍රමාණයක් ලබාදීමට ඉලක්ක කර ඇත.
3.	දිවයින පුරා වැඩසිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ලබා දීම	• කෙටි කාලීන රෝග සහ දිගු කාලීන රෝග සඳහා මුදල් වෙන් කිරීමේදී රෝගයේ ස්වභාවය අනුව රු.3000/- මුදලක්ද, ශල්‍යකර්ම හා ආසාධ්‍ය රෝග සඳහා ද, රු.5000/- බැගින් ජීවිත කාලයටම මූල්‍යාධාර ගෙවීම.
4	වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට පැවිදි ජීවිතය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.	• වැඩමුළු 3 ක් පැවැත්වීම.

06. මූලික කළමණාකරණය යි

බුද්ධශාසන අරමුදල
2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
6.1 ආදායම් වියදම් ගිණුම

	සටහන	2019 රු. ශ	2018 රු. ශ
ආදායම්			
ආයෝජන ආදායම්	5	57,248,998.25	55,063,137.07
ධර්ම ග්‍රන්ථ අලෙවියෙන් ලාභ	6	275,592.60	298,277.00
පරිත්‍යාග සහ වෙනත් ආදායම්	4	25,500.00	5,500.00
මූලික ආදායම් එකතුව		57,550,090.85	55,366,914.07
අඩුකළා : ව්‍යාපෘති වියදම්			
සාමණේර ආයතන ආධාර		1,292,500.00	1,090,000.00
සාමණේර ආයතන - අධීක්ෂණ වියදම්		52,681.00	80,597.00
සාමණේර කැපකරු දායක චාරික මුදල්		4,083,145.00	5,937,659.00
භික්ෂු වෛද්‍යාධාර වියදම්		2,645,206.00	2,219,000.00
සනීපාරක්ෂක කටයුතු සඳහා මූල්‍යාධාර		299,920.00	3,000,000.00
සාමණේර ආයතන විභාග		580,354.00	506,535.00
වැඩිහිටි භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහනට වියදම්		256,555.00	170,499.00
චීන භාෂා පුහුණු වියදම්		352,210.00	257,975.00
පරිපාලන වියදම්			
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා		23,100.00	500.00
පාලක මණ්ඩල පාරිශ්‍රමික දීමනා හා කාර්ය මණ්ඩල වැටුප්		58,151.00	89,163.00
ගමන් වියදම්		18,810.00	13,630.00
පරිගණක පුහුණු දීමනා		166,608.00	214,560.00
අනිකාල		54,536.00	5,136.00
සංග්‍රහ වියදම්		24,056.00	6,085.00
වෙනත් වියදම්		9,454.71	18,672.00
භික්ෂු පුහුණු වැඩසටහන		-	43,634.75
විවිධ ක්ෂය වෙන්කිරීම්			
සේප්පුව		4,310.00	4,310.00
ගොඩනැගිලි ඉදිකිරීම්		87,500.00	87,500.00
ලී බඩු උපකරණ ක්ෂය		5,775.00	5,775.00
ශබ්ද විකාශන යන්ත්‍රය		5,735.00	5,735.00
උපකරණ සහ සවි කිරීම්		16,294.00	16,294.00
වියදම්වල එකතුව		10,036,900.71	13,773,259.75
වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)		47,513,190.14	41,593,654.32

6

14

බුද්ධශාසන අරමුදල
2019-12-31 දිනට ශේෂ පිරික්සුම්

	හර	බැර
	රු ශ	රු ශ
ඇස්ට්‌පුව	57,456.00	
කාර්යාලීය සහ භාණ්ඩ	57,750.00	
සුචි කිරීම් හා කාර්යාල උපකරණ	162,940.00	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත්	187,920,040.00	
අයෝජන ලංකා බැංකුව	37,558,984.73	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කැපකරු ආයක ව්‍යාපෘතිය යටතේ තැන්පත්	42,436,493.50	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමණේර ආයතන ව්‍යාපෘතිය යටතේ තැන්පත්	35,955,701.26	
භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය (ලංකා බැංකුව)	87,686,361.42	
මහජන බැංකුවේ ස්ථාවර තැන්පත්	138,181,200.15	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෛද්‍යාධාර ව්‍යාපෘතිය යටතේ තැන්පතු	15,000,000.00	
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අංක 01125 ඉතිරි කිරීමේ ගිණුම්	13,470,814.59	
ශබ්ද විකාශන යන්ත්‍රය	45,885.00	
ණය	7,000,000.00	
අනුරාධපුර ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම්	3,500,000.00	
බුද්ධ ජයන්ති කාසි තොගය	317,400.00	
විවිධ බෞද්ධ ග්‍රන්ථ	1,094,626.49	
පාලි ටීකා සිංහල පරිවර්තන	375,736.03	
2600 Years of Buddhism ග්‍රන්ථය	5,483,520.00	
පොත් විකුණුම් පිරිවැය	1,698,623.35	
නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් පොත් විකුණුම්	7,988,635.88	
පාලි ටීකා ඉංග්‍රීසි පරිවර්තනය සඳහා නැදිමාල බෞද්ධ මධ්‍යස්ථානයට ලැබූ අත්තිකාරම්	1,080,165.00	
විකුණුම් සඳහා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඇති පොත්	3,955,745.33	
ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලී	2,959,115.77	
ලැබිය යුතු ජාතික ඉතිරි කිරීමේ බැංකු පොලිය	14,140,336.15	
සාමණේර කැපකරු ව්‍යාපෘති පොලී ලැබීම්		4,175,456.75
සාමණේර ආයතන ලැබියයුතු පොලී	5,000,405.88	
ජා.ඉ.බැංකුව - වෛද්‍යාධාර ස්ථාවර තැන්පතු ලැබිය යුතු පොලී	428,210.96	
මහජන බැංකුවේ ස්ථාවර තැන්පත් ලැබිය යුතු පොලී	12,191,543.64	
සාමණේර ආයතන ව්‍යාපෘති පොලී ලැබීම්		3,905,127.18
රාජකීය ආසියාතික සංගමය	7,282.00	
පොලියමින රදවාගත් උපයනවිට බදු ගෙවීම්	1,650,003.26	
මින බැංකුව	51,145,413.22	
ලංකා බැංකුව	932,412.20	
සුළු දීමුල්	-	
ගෙවිය යුතු සාමණේර ආයතන දීමනා		407,500.00
පාලි ටීකා සඳහා නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයට		544,409.50
2600 Years of Buddhism පොත සඳහා ලිපි සැපයීමේ වෙනුවෙන් විදේශීය කතෘන්ට		1,168,025.00
ගෙවිය යුතු දීමුල		1,345,796.00
සුනාමී අධාර		621,776,891.11
බුද්ධශාසන අරමුදල		31,611.36
ජාතික ඉතිරි කිරීමේ ගිණුම් අංක 100011259873 පොලී		472,009.41
ජාතික ඉතිරි කිරීමේ ගිණුම් අංක 100010101125 පොලී	806,645.97	
ජාතික ඉතිරි කිරීමේ ගිණුම් අංක 100011259873	4,083,145.00	
සාමණේර කැපකරු සීමාධාර ගෙවීම්	1,292,500.00	
සාමණේර ආයතන ගෙවීම්	2,645,206.00	
ගිණුම් වෛද්‍යාධාර ගෙවීම්		

බුද්ධශාසන අරමුදල

2019-12-31 දිනට ශේෂ පිරික්සුම

	භාර	
	රු ශ	රු ශ
විනිමාණ වියදම්	352,210.00	
සාමණේර ආයතන විභාග ගිණුම්	580,354.00	
වැඩිහිටි භික්ෂු පුහුණු වැඩසටහන් වියදම්	256,555.00	
සැතිපාරක්ෂක නටයුතු සඳහා මූලාධාර	299,920.00	
ගොඩනැගිලි සමුච්චිත ක්ෂය		525,000.00
සේප්පුව සමුච්චිත ක්ෂය වෙන්කිරීම්		38,790.00
ලී බඩු හා කාර්යාල උපකරණ සමුච්චිත ක්ෂය		34,650.00
ශබ්ද විනාශන යන්ත්‍ර සමුච්චිත ක්ෂය		34,410.00
සවි කිරීම් හා කාර්යාල උපකරණ ක්ෂය වෙන්කිරීම්		97,764.00
ගොඩනැගිලි ක්ෂය	87,500.00	
සේප්පුව ක්ෂය	4,310.00	
ලී බඩු හා කාර්යාල උපකරණ ක්ෂය	5,775.00	
ශබ්ද විනාශන යන්ත්‍ර ක්ෂය	5,735.00	
සවි කිරීම් හා කාර්යාල උපකරණ ක්ෂය	16,294.00	
ජා ඉ බැ සෘජු තැන්පත් පොලී		19,647,221.97
ලං බැ භාණ්ඩාගාර බිල්පත් පොලී		7,687,636.07
ලංකා බැංකුව පොලී		3,742,652.59
මහජන බැංකු පොලී		16,041,469.20
වෛද්‍ය ආධාර		1,545,813.70
පොත් අලෙවි ආදායම්		1,974,215.95
පරිත්‍යාග		6,472,266.18
පරිත්‍යාග ලැබීම්		1,025,500.00
සාමනේර ආයතන අධීක්ෂණ මණ්ඩල දීමනා	52,681.00	
සංග්‍රහ වියදම්	24,056.00	
වෙනත් වියදම්	9,454.71	
ගමන් වියදම්	18,810.00	
ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම්	23,100.00	
පරිගණක දීමනා	166,608.00	
අනිකාල දීමනා	54,536.00	
පාලක මණ්ඩල වියදම්	58,151.00	
භික්ෂු පුහුණු වැඩසටහන	-	
ජාතික ඉතිරිකිරීමේ බැංකු ලැබියයුතු පොලී - කැපකරු	768,111.64	
ලංකා බැංකු ලැබියයුතු පොලී	1,602,755.86	
එකතුව	692,697,215.99	692,697,215.99

බුද්ධශාසන අරමුදල
2019.12.31 දිනට ශේෂ පත්‍රය

	සටහන	2019	2018
		රු. ශ.	රු. ශ.
වත්කම්			
ස්ථාවර වත්කම්	1	10,093,417.00	10,213,031.00
ආයෝජන	2	559,016,241.62	531,760,164.17
මුදල් සංතුලන වත්කම්	3	109,001,484.81	87,624,758.12
		678,111,143.43	629,597,953.29
මෙයින් නිදහස්කාය වන්නේ:			
බුද්ධ ශාසන අරමුදල		669,290,081.25	621,776,891.11
විවිධ පවත්කරු	4	7,472,266.18	6,472,266.18
සුනාම් අතිරේක		1,348,796.00	1,348,796.00
		678,111,143.43	629,597,953.29

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ මිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම් සඳහා බුද්ධ ශාසන අරමුදලේ භාරකරුවන් ලබන පළමු පාලක මණ්ඩලය වෙත භාරදීම් කෙරේ.

බුද්ධ ශාසන අරමුදලේ 2019.12.31 දිනට භාරදීම් කර ඇති ශේෂ පත්‍රය සහ මිණුම් ප්‍රකාශන සම්බන්ධව වගකීම් බුද්ධ ශාසන අරමුදලේ පාලක මණ්ඩලය පසු වන්නේය.

ඩබ්.එම්.ඩී.කුමුදු ඉණවර්ධන
ඇමතිතුමිය
බුද්ධ ශාසන අරමුදල

ඩබ්.ඩී.එච්.රුවිර විතාන
ලේකම්
බුද්ධශාසන අරමුදල

ඒසල්මරත්න විදාන පතිරණ
ලේකම්
බුද්ධ ශාසන අමාත්‍යාංශය
බුද්ධ ශාසන අරමුදලේ
පාලක මණ්ඩල සාමාජික

නීතිඥ සෝම ධර්මවර්ධන
මහාභාරකාර කැන
බුද්ධ ශාසන අරමුදලේ
පාලක මණ්ඩල සාමාජික

මගේ අංකය
எனது இல.
My No. } පිවිද්/සි/බිවිඑස්/2019/එෂ්ඩ්

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 පෙබරවාරි 1 දින

ලේකම්
බුද්ධශාසන අරමුදල

බුද්ධශාසන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව

යටෝක්ත විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39 (1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙනද, භාණ්ඩාගාර ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතුය.

03. පනතේ 39 (2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳ ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු නිබේනම් ඒ බවද මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

එච්.ඩබ්.රණසිංහ මුණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - 1 .අමාත්‍යතුමා. බුද්ධශාසන. ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
2 අමාත්‍යතුමා. මුදල් අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

2023 ජනවාරි 17 දින

සීඒඒ/සී/බීඑස්එෆ්/2019/එෆ්ඒ

ලේකම්

බුද්ධශාසන අරමුදල

බුද්ධශාසන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව

බුද්ධශාසන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කරන ලද විගණනයේ ප්‍රතිඵල මෙම වාර්තාව මඟින් නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදලේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධව සමස්තයක් ලෙස බැලීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

පිටුව 1 | 14

19

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික යහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ යෙදෙහන් කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජනා කරනු ලබන පියවර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත අරමුදලේ පාලක මණ්ඩලය විසින් මා වෙත දැන්වීම අවශ්‍ය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම් මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම් මගින් සිදුවන්නාවූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම හා ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය මිනුම් විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස භාවිතාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවක් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.4 මූල්‍ය ප්‍රකාශන

1.4.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

	විෂයය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	නව නිරීක්ෂණය ක්ද/පවත්නා නිරීක්ෂණය ක්ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(c)	ගෙවීම්	4,260,906	ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි/ලදුපත්	පවත්නා නිරීක්ෂණය කි	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය	රු.4,360,906 ක ගෙවීම්වලට අදාල වවුචර් අතරින්, ➢ අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත . ➢ අනිකාල හා ගමන් වියදම් ලද බවට තහවුරුවක් ලබා ගෙන ඉදිරිපත් කල හැක. ➢ වෛද්‍යාධාර ගෙවීම් බහුතරයක් ලදුපත් එවා ඇති අතර ,වෙනම ගොණුවක එම ලදුපත් ගොණු කර ඇත . ➢ සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ මුදල් ගෙවීම් තහවුරු කර ගැනීම සිදු කර විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී . ➢ චීන භාෂා ව්‍යාපෘතියට ගෙවීම් වලට අදාල ලදුපත් වල පිටපත් මේ සමඟ ඉදිරිපත් කර ඇත .	ගෙවීම් ලද බව සනාථ කළ හැකි පරිදි ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි/ලදුපත් අදාල වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු බව

						ඉදිරියේදී කරනු ලබන සියළු ගෙවීම් සඳහා ලියුපත් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත.
(ආ)	බෞද්ධ ධර්ම ග්‍රන්ථ	6,953,882	සමීක්ෂණ මණ්ඩල වාර්තා	පවත්නා නිරීක්ෂණය කි	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය	ග්‍රන්ථ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර 2022 වසරට අදාල ග්‍රන්ථ සමීක්ෂණයක් කිරීමට සැලසුම් කර ඇත.	සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතු බව.
(ඇ)	සුනාමි ආධාර	1,348,796	විස්තරාත්මක තොරතුරු	පවත්නා නිරීක්ෂණය කි	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය	සුනාමි ආධාර ලෙස සඳහන් රු.1,348,796/- ක ශේෂය 2007 වසරේ සිට පැවත එන ශේෂයකි.	ශේෂය සත්‍යාර කළ හැකි තොරතුරු ඉදිරිපත් කළ යුතු බව.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.13.031,828 ක් වූ අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු ශේෂයෙන් රු.1,087,447 ක් වසර 06 කට සහ රු. 11,944,381 ක් වසර 03 කට වඩා පැරණි ශේෂ බව පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව නිරීක්ෂණය වූ අතර එම ශේෂ අය කර ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.	පවත්නා නිරීක්ෂණයකි	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය	එම ශේෂයන් 2023 වසර තුළ දී අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇත.	දීර්ඝ කාලයක සිට පැවතෙන ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව

1.5.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.1,712,435 ක් වූ ජංගම වගකීම් ශේෂයෙන් රු.544,409 ක් වසර 04 කට සහ රු.1,168,025 ක් වසර 03 කට වඩා පැරණි ශේෂ වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	පවත්නා නිරීක්ෂණයකි	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය	එම ශේෂයන් 2023 වසර තුලදී නිරවුල් කිරීමට හෝ සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.	දීර්ඝ කාලයක සිට පැවතෙන ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව

1.5.3	අත්තිකාරම්			
	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස්	නිර්දේශය
	මුදල් රෙගුලාසි 371(2) අනුව යම් නිශ්චිත කාර්යයකට ලබා ගත් අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමවූ විගස පියවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර අත්තිකාරම් පියවීමට දින 14 කට අධික කාලයක් ගත කර තිබූ අවස්ථා 10 ක් සමාලෝචිත වර්ෂය තුළ පැවති අතර අත්තිකාරම් පියවන තෙක් ඉතිරි මුදල් අත රඳවා ගෙන සිට ඇති බව ද නිරීක්ෂණය විය. තවද, අත්තිකාරම් ගෙවීමේදී අදාළ මුදල් ලබා ගත් බවට ගෙවීම් ලද අයගේ අත්සන ලබා ගැනීමට කටයුතු කර නොතිබූ බව වවුචර් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය	පවත්නා පද්ධතිය වැඩිදියුණු කළ යුතුය	මෙම දුර්වලතා නිවැරදි කර ගැනීමටත් ඉදිරියේදී එවැනි දුර්වලතා ඇති නොවීමට වග බලා ගැනීමටත් කළමනාකාරිත්වය අදහස් දැක්වීම උපදෙස් ලබා දී ඇත	අත්තිකාරම් ගෙවීම් සහ පියවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක්ද පවත්නා නිරීක්ෂණයකි.	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396	2013 සිට2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුලදී අරමුදල විසින් නිකුත් කරන ලද රු.56,863 ක් වූ වෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට මෙම වාර්තාවේ දිනය වන විටත් පියවර ගෙන නොතිබුණි.	පවත්නා නිරීක්ෂණයකි.	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	එම වෙක්පත් 07 ආදායමට බැර කිරීමට හැකියාව ඇති බැවින් රජයේ ආදායමට බැර කර වාර්තා කිරීමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.47,513,190 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.41,593,654 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,919,536 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ආදායම වැඩිවීමත් සාමණේර කැපකරු දායක මුදල් ගෙවීම සහ සනීපාරක්ෂක කටයුතු සඳහා ආධාර දීම අඩුවීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 264 හි සඳහන් අවශ්‍යතාවය අනුව සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, (අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ) කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත් බොහෝ ගෙවීම් වවුචර්	පවත්නා නිරීක්ෂණයකි	පවත්නා පද්ධතිය වැඩිදියුණු කළ යුතුය	සාමණේර ආයතන ගෙවීම් සම්බන්ධයෙන් මෙම විමසීම් ඉදිරිපත් වී අතර,සාමණේර ආයතන ගෙවීම් සිදු කරනු ලබන්නේ කලින් සිදු කල ගෙවීම් ලද බවට ලදුපතක් ලැබීමෙන් පසුව පමණි. ඒ අනුව කලින් සිදු කල ගෙවීමට	මුදල් රෙගුලාසි ප්‍රකාරව, අදාල ගෙවීම් ලද බව සනාථ කළ හැකි පරිදි ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි/ලදුපත් ඊට අදාල වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු බව

සමහ වෙනත් ගෙවීම්වලට අදාල රිසිට්පත්/ලදුපත් පරීක්ෂා කිරීමකින් / වගකීමකින් තොරව අමුණා තිබුණි				අදාල ලදුපත ලැබුණු බව් සහතික කර ගත හැකි වන පරිදි නව ගෙවීම් වවුවරයට ලදුපත ඇමිණීම සිදු කර ඇත. වර්තමාන ගෙවීම් වලට අදාල ලදුපතේ පිටපතක් අදාල ගෙවීම් වවුවරයට ඇමිණීම සිදු කරනු ලබයි.2022,2021,2020 වසරවල වවුවර්පත් වලට අදාල එම නිවැරදි කිරීම් සිදු කිරීමට නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇත.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක්ද	පාලන අවදානම් ආනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී රු.57,550,091 ක් අරමුදලේ	පවත්නා නිරීක්ෂණයකි	පවත්නා පද්ධතිය වැඩිදියුණු කළ යුතුය	ඉදිරියේදී අරමුදලට ලැබෙන ආදායම් පදනම් කරගෙන ඊට සරිලන අන්දමේ වැඩසටහන්	අරමුදලට ලැබෙන ආදායමට අන්දමේ වැඩසටහන් සරිලන

ආදායම් ලෙස ලැබී තිබුණ ද එයින් රු.10,036,901 ක් එනම් සියයට 17 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණි. තවද, වාර්ෂිකව අතිරික්ත වන මුදල් ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ආයෝජන වටිනාකම රු.559,016,242 ක් විය. බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන් සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට ක්‍රියාත්මක කිරීමට යෝජිතය. කටයුතු කළ යුතු බව

30

4. ගිණුම්කටයුතුහාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 දෙසැම්බර් 22 දිනැති අංක පිඑස්/423 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 15 ඡේදය මඟින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877(2) (ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ දෙකකුත් මාස 09 ක කාල පමාවකින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.	පවත්නා නිරීක්ෂණයකි.	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	අදහස් දක්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි සහ වක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව.

එච්.එම්. රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට